# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2075/29 - 2018 ජුනි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2018.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය)**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ (1) වගන්තිය යටතේ**
**වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ (1) වගන්තිය යටතේ වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයකු ලෙස පත්වූ ස්වාධීන කණ්ඩායම් 01ට අයත් වන්නා වූ සේනාධීර මුදුන්නගේ ඩග්ලස් ඉන්දික සේනාධීර නම්වන ස්වාධීන කණ්ඩායම් නායකට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නාවූ ද, එම වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායම් නායක විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කටුවල කන්දේ ගමලද්දලාගේ ප්‍රදීප් අරුණ කාන්ත නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී එන්. රේගන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 66අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කටුවල කන්දේ ගමලද්දලාගේ ප්‍රදීප් අරුණ කාන්ත, වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ තෝරා එවා අති සභිකයකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එන්. රේගන්,
තේරීම් භාර නිලධාරී,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව.

2018 ජුනි මස 12 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
පුත්තලම.

06 - 1050


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*